## එක්සත් ආගමික ප්‍රයත්නය- United Religions Initiative

1993 දී කැලිපොනියා වේ විසු එපිස්කොප්ල් බිෂෝප් වරයෙක් වු විලියම් ස්විං බිෂොප්වරයාට එක්සත් ආගමික ප්‍රයත්නය( United Religions Initiative ) පිළිබඳ අදහස මුලිකව ඇති විය. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අත්සන් කර 50 වසරක් සපිරුනු අවස්ථාවේ ඒ සඳහා වු සැමරුම් උළෙලක් ඇමරිකාවේ සැන්පැන්සිස්කෝ නුවර පැවති අතර එයට සමගාමීව ආගමික නායකයින්ගේ විෂාල පිරිසකගේ සහභාගිත්වයකින් ලෝක සමුළුවක් කැදවනු ලැබීය.මෙහිදී ඔවුන්ගේ අදහස වුයේ ලෝකයේ රාජ්‍යයන් ලෝක සාමය ගැන සාකච්ඡා කරන විට ලෝක ආගම් ලෝක සාමය සදහා කුමක් කරන්නේද යන්නයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස URI සංවිධානය 2000 ජුනි 26 දින ලොව පුරා විසිරි සිටින විවිධ ආගමිකයින්ගේ එකතුවකින් ආරම්භ විය.

## පූර්විකාව( Preamble )

ආගමික විවධත්වයෙන් ද අධ්‍යාත්මික භාව ප්‍රකාශණයන්ගෙන්ද ස්වදේශිය සම්ප්‍රදායික පිළිවෙත් වලින් ද සමන්විත වු ලෝකය පුරා විසිරුනු ප්‍රජාවක් ලෙස එකට එක් වුනු අපි ආගම් නිසා ඇතිවන හිංසනය පිටු දකිමින් මිහිතලයේ සාමය යුක්තිය හා ශාන්තිය සියළුම සත්‍යවයන්ට සාක්ෂාත් කරලීම උදෙසා එක්සත් ආගමික ප්‍රයත්නය නම් වු සංවිධානය පිහිටුවා ගතිමු .

- අපි සැම පිලිවෙත් ඇදහීම් හා විස්වාසයන් වල ඇති වෙනස් කම් හා අනන්‍යතාවයන් ගරු කරන්නෙමු.
- අන්න්‍යයන්ගේ ගරුත්වය උදෙසා හඬ නගන්නන්ට මෙන්ම අපගේ වටිනාකම්ද ඥාණයද බෙදාහදාගනිමින් සියළු දෙනාගේම යහපත සඳහා ක්‍රියා කරන්නන්ට අපි ගරු කරන්නෙමු.
- ආගමික හා ආධ්‍යාත්මික ජීවිත,අපව බෙදා වෙන්කරනු වෙනුවට එකිනෙකාට ගරු කරනු ලබන ප්‍රජාවක් බිහිකල හැකි බව විස්වාස කරන්නෙමු.
- එබැවින් අපගේ සම්ප්‍රදායන් තුල මුල්බැසගත් ස්වාධීන ප්‍රජාවක් ලෙස ලෝක ප්‍රජාවගේම යහපත පිණිස අපට දැන් එකට එකමුතු විය හැක
- සාමයේ හා නීතියේ සංස්කෘතිය ගොඩ නැංවීම සඳහා අප එක් වෙමු.
- පෘතුවියේ ආරක්ෂාවටත් ශාන්තියටත් අප එකට එක් වෙමු
- ගැටුම් සමථනකරනයට ශාන්තිට හා ප්‍රතිසංධානයට සුදුසු ආරක්ෂිත ස්ථානයක් අපි එකට එක්ව ගොඩ නගමු.
- ජාත්‍යන්තර නීතියට අනුකුලව පුද්ගල හා සාමුහික මානව අයිතීන් හා ආගමික හා අධ්‍යාත්මක භාව ප්‍රකාශන සඳහා ඇති නිදහස තහවුරු කිරීමට සහාය සඳහා සඳහා අප එකට එක් වෙමු
- ලෝක ප්‍රජාව මුහුණ දෙන ආර්ථික පාරිසරික දේශපාලනික හා සමාජ අභියෝග සඳහා අපගේ ආගම් අධ්‍යාත්මික භාව ප්‍රකාශන සම්ප්‍රදායික වත් පිලවෙත් වල ඇති වටිනාකම් හා ඥානය යොදවමින් වගවිම් සහිත සාමුහික ක්‍රියාවලයක් සඳහා අප එකට එක්වෙමු.

- සියළුම ප්‍රජාවට සහභාගිවීමට හැකි විශේෂයෙන්ම නිතර නොඇසෙන හඩවල් සදහා  ගෝලීය අවස්ථාවන්  සපයා දීමට අප එකට එක්වෙමු.

- ස්ථිර හා වෙනස්වන ස්භාවයන් තුල ඥාණයේ ආලෝකය හා ආශිර්වාදයේ සතුට සැමරීමට අප එකට එක්වෙමු.

- ලෝක ප්‍රජාවන් අතර ආදරය හා යුක්තිය පසිදුලීමට අහිංසාවාදී කාරුණික ක්‍රියාදාමයන් යොදවිමින් ද ගැඹුරු සත්‍යයන් අවදි කරවීම සදහා අපගේ  සම්පත්  එකතු කොට භාවිතා කිරීමට අපි එකට එක් වෙමු.

## අභිමතාර්ථය( Purpose )

එක්සත් ආගමික ප්‍රයත්නයේ අභිමතාර්ථය වනුයේ චිරස්තායීව දෛනිකව  අන්තර් ආගමික සහ සම්බන්ධතාවයන්  වර්ධනය කරලීමින් ආගමික උද්දීපනය නිසා ඇති වන ගැටුම් අවසන් කරමින් මිහිතලය තුල සාමය, යුක්තිය හා සුවපත් කිරීමේ සංස්කෘතියක් සියළුම සත්‍යවයින් වෙනුවෙන් නිර්මාණය කිරීමයි.

## මූල ධර්ම( principles )

01. එක්සත් ආගමික ප්‍රයන්තය (URI) ආගමක් නොවන අතර එය සම්බන්ධතා වර්ධනය කරනු ලබන සංවිධානයකි .

02. එක් එක් ආගම්වල,ආධ්‍යාත්මික භාව ප්‍රකාශනයන්ට හා ස්වදේශිය පිළිවෙත් වල පූජනීය ඥානයන්ට අපි ගරු කරන්නෙමු .

03. ඒ ඒ ආගම්වල , ආධ්‍යාත්මක භාව ප්‍රකාශනයන්වල හා ස්වදෙශීය පිලිවෙත්වල ඇති විවධත්වයන්ට අපි ගරු කරන්නෙමු.

04. අපි ඔවුනොවුන්ගේ සම්ප්‍රදායන්  තුල ගැඹුරින් මුල් බැස ගැනීමට දිරි ගන්වන්නෙමු.

05. ගැඹුරු අවබෝධයකින් හා විස්වාශයක් සහිතව අප අන් අයට ඇහුම් කන් දෙන්නෙමු ,කථා කරන්නෙමු.

06. අපි ආගන්තුක සත්කාරය ලබා දීමටත් ලබා ගැනීමටත් කටයුතු කරන්නෙමු.

07. වෙනස්කම් වලට භාජනය නොකරමින්  විවිධත්වය හා නව පරිශීලනයන්  සදහා වූ අවශ්‍යතාවන්  ලබා ගැනීමට  අපි උත්සහා ගන්නෙමු

08. අපි ඔසෘෂ ක්‍රියාදාමන්හි ස්ත්‍රි පුරුෂ සමානාත්මතාවය රකින්නෙමු.

09. අපි හිංසනයෙන් තොරව ගැටුම් නිරාකරනය කිරීමට ප්‍රතිසංධානය හා ශාන්තිය භාවිතා කරමු.

10. වර්ථමාන හා අනාගත පරපුරේ හිතසුව පිණිස පරිසර සංරක්ෂනය කරලීමටද  ආරක්ෂාකිරමටද අපි කටයුතු  කරන්නෙමු.

11. අපි අනෙකුත් අන්තර් ආගමික උත්සහායන් සොයා බලා සහයෝගය දෙන්නෙමු.

12.අපි අපගේ අරමුණු ,ප්‍රතිපත්ති හා මූල ධර්ම පිළිගනු ලබන සංවිධාන හා පුද්ලගයින් URI හි සාමාජිකත්වයට පිළිගන්නෙමු.

13. ප්‍රාදේශීය මට්ටමින් විපතටපත් පාර්ශව හා අදාල පාර්ශව සම්බන්ධව තීරන ගැනීමට ඇති අයිතිය තහවුරු කරමු.

14.URI අරමුණු, ප්‍රතිපත්ති හා මූලධර්මයන්ට අනුකූලව කවර හෝ තරාතිරමකට ,අන්දමකට ,ක්‍රියාදාමයක් ගැනීමට ඇති අයිතිය තහවුරු කරමු.

15. අපේ සියළුම සාකච්ඡා හා විචාරයන් සියලුම පාර්ශවයන් හා විවිධත්වයන් සහිතව සර්ව සාධාරණව සිදුකරනු ලබන අතරමඒ තුලින් කිසිවකුත් උස්පහත් වීමකට ලක් නොවනු ඇත.

16.URI හි සෑම කොටසක්ම ස්වං පාලනය හා සම්පත් භාවිතාව සඳහා යොදවනු ලබන්නේ අපගේ අරමුණු,ප්‍රතිපත්ති හා මූලධර්මයන්ට අදාල ප්‍රවාහයන්ට පමනි.

17. අප අපගේ භූමිකාවට අවශ්‍ය මූල්‍යමය හා අනිකුත් සම්පත් දියුණු කර ගැනීමට කටයුතු කරනවා සේම අනිකුත් පාර්ශව වල අවශ්‍යතා සඳහාද එම පහසුකම් සපුරා ගැනීමට උදව් කළ යුතු වේ.

18. සම්පත් ඉතා අරපිරිමැස්මෙන් භාවිතා කිරීමටද සාධාරන හා සත්‍ය තොරතුරු අවංකවත් සදාචාරාත්මකවත් අපි ඉතා උසස් අන්දමින් පවත්වා ගෙන යායුතුය.

19. සංවිධානය පිළිබද දැනුවත්වීමටද ඒවා උපයෝගීකර ගැනීමටද අපි කැපවෙමු.

20. අපි සෑම භාෂාවකම ඇති උසස් බව හා විවිධත්වයට ගරු කරන අතර සහභාගිවන්න්ගේ අයිතියක් හා වගකීමක් සේ සලකා URI ප්‍රඥප්තිය,ව්‍යවස්ථාවලිය,අතුරු ව්‍යවස්ථා සහ අදාල අනිකුත් ලේඛන වන පූර්විකාව,අරමුණු හා මූලධර්ම අනිකුත් භාෂාවන්ට පරිවර්ථන කළ යුතුය.

21.URI සාමාජිකයින් මොනම ආකාරයකටවත් යාග හෝම වලට හෝ වෙනත් ආගමකට බලහත් කාරයෙන් හැරවීම හෙලා දකින්නෙමු.

**විමසීම්(Inquiries )**


| Local | International |
|---|---|
| United Religion Initiative<br>Shanthi Sena CC<br>No 72/ 5, Rawathawatatta Road,<br>Moratuwa - Sri Lanka<br>0112655049 / 0777636302<br>sarvoshanthi@sltnet.lk | United Religion Initiative<br>P.O.Box 29242<br>San Francisco, CA 94129<br>U.S.A<br>001 415 561 2300 / 001 415 561 2313<br>office@uri.rg |

## Get Started

### URI සහයෝගීතා කවයක් ආරම්භ කිරීම – ආරම්භක පියවරයන්

### 01. ප්‍රජාව සම්බන්ධ කර ගැනීම(Gather People Together )

URI සහයෝගීතාවයක් ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් සාමාජිකයින් සත් දෙනෙකුවත් සම්බන්ධ කර ගත යුතුය. සහයෝගීතා කවය විවිධත්වයන් පිළිගනු ලබයි. මෙහි සමාජිකත්වය අවම වශයෙන් ආගම් , අදහිලි හෝ ස්වදේශිය චාරිත්‍රයන් අනුගමනය කරන කංඩායම් වලින් අවම වශයෙන් තිදෙනෙකුවත් නියෝජනය විය යුතුය. සමිති හෝ සංවිධාන වශයෙන්ද මෙහි සමාජිකත්වය ලබා ගත හැක. ඔබ ආරාධනා කළ යුත්තේ කවුරුන් හටද ? ආර්ම්භක අවස්ථාවේ ඔබ දන්නා හඳුනන අයට ආරාධනා කරන්න. ඉන් පසු ඉහත සඳහන් ආගමික කංඩායම වලට ආරාධනා කරන්න.

සහයෝගිතාකවයක් ආරම්භ කිරීමෙන් යම් ප්‍රතිඵලයක් ලැබිය හැකියැයි ඔබ සිතන අනිකුත් කංඩායම් හෝ පුද්ගලයින් සඳහාද ආරාධනා කරන්න.URI තුලින් ඔවුන්ට ප්‍රයෝජනයක් ලබා ගත හැකි සේම ඔවුන් ට URI සදහා කළ හැකි සේවය අවබෝධකර ගැනීමට ඔවුන්ව උනන්දු කරන්න.

### 02. පූර්විකාව, ප්‍රතිපත්ති හා මුළ ධර්ම ආවර්ජනය කිරීම
### (Reflect on the preamble, purpose and Principles)

සහභාගි වන කංඩායමට පූර්විකාව, ප්‍රතිපත්ති හා මුළ ධර්ම පිළිබඳ හොඳින් කියවීමට අවස්ථාව ලබා දෙන්න.එක් එක් සාමාජිකයා ලවා එක් ජේදයක් කියවීමට අවස්ථාව සලසන්න. මෙ අනුව සියලුම සහභාගිවන්නන් මේ සදහා සම්බන්ධ කර ගත යුතුය. මෙහි අඩංගු වචන වල ඇති උද්දීපනය, වැගත්කම හා අභියෝග පිළිබඳ ආවර්ජනය කිරීමට අවස්ථාව සලසන්න.මෙම වචන වලින් පිළිඹිබු වු වටිනාකම් වලින් කොටසක් ඔබේ ජීවිතයට යම් අවස්ථාවක යම් බලපෑමක් වූයේද ? යන්න මෙනෙහි කරන්න. මෙම ප්‍රතිපත්ති කොතරම් දුරට ඔබ කංඩායමට සම්බන්ධකර ගත හැකිද ?

### 03. එකිනෙකාගේ වටිනාකම් හා හැකියාවන් අගය කිරීම( Appreciate One Another's and Values )

එකිනෙකා හදුනා ගැනීම ආරම්භ කරන්න. සහභාගිවනන්ගේ බලාපොරෝත්තු, වටිනාකම්, අද්දැකීම් හා හැකියාවන්, අගයමින් සම්මුඛ සාකච්ඡා ස්වරූපයෙන් හදුනා ගැනීම සිදු කරන්න.

භාවනාවකින් හෝ ආගමික ඇදහිකමකින් පසු අර්ථවත් ක්‍රියාදාමයක් වන ඇගයීමේ සාකච්ඡා ආරම්භ කළ හැක.

### 04.ඇගයීමට ලක් කරන සම්මුඛ සාකච්ජා( Appreciative Interview )

සහභාගිවන්නන්ට යුගල වශයෙන් වෙන් කරන්න. එම ඒක් එක් යුගල අතර පහත සදහන් ආකාරයට ඇගයමට ලක් කරන සංවාද පැවත්වීමට සලස්වන්න.

### 1.අන්තර් ආගමික හමුවීම් තුලින් ලැබුනු අන්තර් ඥාණයන් ( Insights from important interfaith encounters )

ලෝකය කුඩා වෙත්ම අනිකුත් ආගම් හෝ ආධ්‍යාත්මික පිළිවෙත් වලින් පැමිණෙන ප්‍රජාවන් සමග අපට විශාල අද්දැකීම් ලබා ගැනීමට වැඩිපුර අවස්ථාවන් සැලසේ. අන්තර් ආගමික හමුවීම් වලදී සිදුවු විශේෂයෙන්ම ඉතා වැදගත් මෙන්ම ප්‍රතිඵලදායක නිහතමානිත්වය හා පුදුම එලවන සුළු එවැනි අවස්ථාවන් තුලින් අව්‍යාජ මිත්‍රත්වයක් තහවුරු කර ගැනීමට හැකි වු කථා ඔබට බෙදා හදා ගැනීමට හැකිද ?

### 2. සහයෝගයෙන් වැඩ කල අවස්ථාවක අද්දැකීම්(Experience with cooperative action )

අප බොහෝ අවස්ථාවල අපගේ අපේෂාවන් වු වඩා හොද ලෝකයක් බිහි කිරීමට සෙසු අය සමග සම්බන්ධවී කටයුතු කළ අවස්ථාවන් ඇත. ඔබගේ ජීවිතයේ ඔබ සම්බන්ධ වූ එවැනි උසස් අවස්ථාවක් සිහියට නගා ගන්න. වඩා හොද ලෝකයක් බිහි කිරීමට එය කෙසේ ඉවහල් වීද එවැනි අද්දැකීමක් සහිත කතතන්දරයක් සෙසු අය සමග බෙදා හදා ගන්න.

### 3. වඩා හොද ලෝකයක් සදහා වු මැවෙන දර්ශනය.( Vision of a better world )

වසර 30 ක් ඉදිරියට ඔබේ සිත රැගෙන යන්න. එහිදි ඔබ අපේක්ෂා කරනු ලබන ලෝකය කුමක් විය යුතුදැයි සිතන්න. ඔබගේ අපේක්ෂාවන් සිතුම් පැතුම් වලට අනුකූලව එම ලෝකය ගොඩ නැගෙන අන්දම සිහියට නගා ගන්න. එම ලෝකය මෙම මොහොතේ ඔබට කෙසේ දර්ශනය වේද.

### 4. අන්තර් ආගමික සහයෝගය( Interfaith Cooperation )

අන්තර් ආගමික සහයෝගය තුලින් වඩා හොද ලෝකයක් නිර්මාණය කර ගත හැක්කේ කෙසේදැයි සිතෙහි මවා ගන්න. විවිධ වු ආගම් ඇදහිලි විස්වාසයන් ඇති අය එකට එක්වී වැඩ කිරීම තුලින් ඇතිවන තත්වය මෙනෙහි කරන්න.ඔබගේ ක්‍රියාදාමයන් තුල එවැනි අය ලෝකය පුරා ජාල ගත වීමෙන් එය බලවේගයක් වී ලෝකයට වන යහපත ගැනද සිතන්න. ඔබගේ ක්‍රියාදාමයන් තුලින් මෙවැනි තත්වයක් සාක්ෂාත් කර ගත හැකිද ?

## සාමාජිකත්වය ලබා ගැනීමට ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීම
## (Complete the Application for Membership)

**1. සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සම්පූර්ණ කරන්න.**
**( Meet the eligibility requirements )**

සහයෝගීතාකවයක් අවම වශයෙන් සමාජිකයින් 7 දෙනෙකගෙන් සමන්විය යුතුය. සහයෝගිතාකවයන් විවිධත්වයට ගෞරුකරන අතරම එයි පිළිගනු ලබයි එහි සංයුතිය අවම වශයෙන් ආගම් , දේශිය ඇදිහිල හෝ අධ්‍යාත්මික වත්පිළිවෙත් අනුගමනය කරන කංඩායම් තුනකින්වත් සමන්විය යුතුය. එමෙන්ම පුද්ගලයින්ට හෝ සමිති සමාගම්වලට හෝ සංවිධානවලට මෙහි සාමාජිකත්වය ලබා ගත හැක.

**2. ඔබගේ සහයෝගීතා කවයට සුදුසු නමක් හා අරමුණක් ඇති කර ගන්න.**
**(Decide the name and purpose of your Cooperation Circle.)**

URI හි මූලික අරමුණු පිළිබිඹු වන පරිදි ඔබ සහයෝගීතා කවයේ අරමුණ තෝරා ගන්නා ලෙස අප ඔබව උනන්දු කරවනු ලැබේ. ඔබ පිරිස එකට එකු විමෙන් කුමන මූලික හේතුවක් අරමුණට අදාලව ප්‍රකාශිත වන්නේද

**3. සහයෝගීතාකවයට සම්බන්ධ කර ගත යුත්තේ කුමන අයදැයි තීරණය කරන්න.**
**(Decide who will participate in the CC.)**

නිතර නොඇසෙන හඩවල් සහිත විවිධත්වයක් ඇති කංඩායම් URI නිරන්තරයෙන්ම පිළිගනු ලැබේ. ඔබගේ සහයෝගීතා කවය කුමන ආකාරයේ විවිධත්වයක් පිළිඹිබු කරයිද , පුද්ගලයන්,සංවිධාන කොපමන සංඛ්‍යාවකට මේ සදහා ආරාධනා කරනු ලබන්නේද ?

**4. තීරන ගැනිමේ ක්‍රියාවලිය තින්දු කර ගැනීම(Choose the decision-making processes.)**

සහයෝගීතාකවයන්ට ස්වයංව සංවිධානය වීමට අයිතියක් ඇත. ඔවුන්ගේ සාකච්ඡා හා තීරණ ගත යුත්තේ පීඩාවට පත් විවිධ කංඩායම් නියෝජනයවන ආකාරයේ ක්‍රමයන් භාවිතා කරමින්ය. නමුත් කිසියම් කොටසක් අභිබවා යන සේ ඉඩ නොතැබිය යුතුය. ඔබගේ කංඩායමේ තීරණ ගත යුතු ආකාරය සාකච්ඡා කරන්න. තීරන ගන්නා ක්‍රියාවලිය හදුනා ගන්න.

**5. ප්‍රඥප්තියට ප්‍රකාරව සාමාජිකයින්ගේ වගකීම් හා අයිතිවාසිකම් පිළිබද සාකච්ඡා කිරීම**
**(Discuss rights and responsibilities of members listed in the Charter.)**

ඔබ කංඩායමේ වගකීම් සහ අයිතිවාසිකම් පිළිබද ගැටළු පැණ නැගුනහොත් සාකච්ඡා කර එවා නිරාකරනය කර ගන්න.

**6.URIජාත්‍යන්තර සංවිධානයට පරිත්‍යගයක් ලබා දීම(Give a gift to the URI.)**

සහයෝගීතාකව තම මූල්‍යමය හා වෙනත් සෙසු සම්පත් දියුණු කර ගෙන තම කවයේ අවශ්‍යතා හා සෙසු URI අනිකුත් කංඩායම් වල අවශ්‍යතා සැපිරීමට සහයෝගීතා කවවලට වගකීමක් ඇත. ලෝක ව්‍යාප්ත **URI** ප්‍රජාවට උදව් දීමක් වශයෙන් මූල්‍යමය පරිත්‍යාගයක් හෝ සේවාවක් ලබා දීමට සහයෝගීතා කව වලින් ඉල්ලීමක් කරනු ලැබේ. කුමන අන්දමේ මූල්‍යමය හෝ සේවා සහායක් ලබාදිය හැකිදැයි ඔබගේ කවය තුල සාකච්ඡා කරන්න.

**7. සහයෝගීතා කව ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත්URI ගෝලීය මණ්ඩලයට යොමු කිරීම**
**(Groups interested in forming a CC apply to the URI Global Council for membership.)**

URI වෙබ් www.uri.orgපිටුවෙන් හෝ කළාපීය කාර්යාල වලින් මෙම ඉල්ලුම් පත් ලබා ගත හැක.

වැඩි විස්තර සඳහා පහත සදහන් අයගෙන් විමසිය හැක.

| Inquiries in Sri Lanka | Inquiry in URI Hub - San Francisco |
| --- | --- |
| රවීන්ද්‍ර කන්දගේ<br>අංක 72/ 5, රාවතාවත්ත පාර<br>මොරටුව<br>00941 2655049 / 0094 777636302<br>sarvoshanthi@sltnet.lk | Maria Crespo<br>CC Approval Committee Chair<br>URI Global Office<br>Mail P.O.Box 29242<br>San Francisco CA 94129<br>mcrespo@uri.org |